නමෝ බුද්ධාය

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 187

ශ්‍රී. බු. ව. 2559 | 2016 ජනවාරි 23 | දුරුතු කළාපය

# වනිතා පරපුරේ වටිනාකම

ආචාර්ය

**අතිපූජ්‍ය මුරුංගාස්‍යායේ සදාණිස්සර නා හිමිපාණන් වහන්සේ විසිනි**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

**ඉත්ථීපිහි ඒකච්චියා - සෙය්‍යා පොස ජනාධිප**
**මෙධාවිනී සීලවතී - සස්සුදෙවා පතිබ්බතා**

**තස්සා යො ජායති පොසො - සූරො හොති දිසම්පති**
**තාදිසා සුභගියා පුත්තො - රජ්ජම්පි අනුසාසති ති**

පින්වතුනි

රජතුමනි, ඇතැම් ස්ත්‍රිය ද ශ්‍රේෂ්ඨය, එහෙයින් පෝෂණය කරනු මැනවි. නුවණැති, සිල්වත් නැදි මයිලන් දෙවිකොට වෙසෙන, පවතින රක්නා, යම් ස්ත්‍රියක් වේද, දිශාවන්ට අධිපති රජතුමනි, ඇයට යම් පුතෙක් උපදීද , හෙතෙමේ දක්ෂයෙක් වෙයි. එබඳු යහපත් තැනැත්තියගේ පුත්‍ර තෙමේ රාජ්‍යානුශාසනාද කෙරෙයි.

පින්වතුනි,

සැවැත් නුවර ජේතවනාරාමයට බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණ සිටි පසේ නදී කෝසල රජතුමාට එහි පැමිණි රාජ පුරුෂයෙක් මල්ලිකා දේවියට දියණියක් උපන් බව දන්වා සිටියේය. දියණියක් උපන් බව අසා නොසතුටු සිතින් පසුවූ රජතුමාට ස්ත්‍රියකගේ ඇති ශ්‍රේෂ්ඨත්වය ඉහත සඳහන් ගාථාව තුළින් බුදුරජාණන් වහන්සේ පහදා දුන්හ.

එකල භාරතයේ පැවති පිළිගැනීම් වලට අනුව ස්ත්‍රියකගේ උපත පහත් කොට සැළකීමේ සිරිතක් දක්නට ලැබිණ. කුඩා කාලයේ මව්පියන්

යටතේත්, විවාහ දිවියට ඇතුලත් වූ පසු ස්වාමි පුරුෂයා යටතේත්, මහලු වූ පසු දරුවන් යටතේත්, ස්ත්‍රිය වාසය කළ යුතු යැයිද, ඇයට ස්වාධීනව කටයුතු කිරීමට ඉඩ නොදිය යුතු යයිද, එකල තිබූ පිළිගැනීම විය. මෙම මතයට එරෙහිව කරුණු දේශනා කළ බුදුරජාණන් වහන්සේ ස්ත්‍රියද පුරුෂයා මෙන් ශ්‍රේෂ්ඨත්වයට පත්වන බව පැහැදිලි කර දුන්හ. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනුවෙන් තම ශ්‍රාවක පිරිස සංවිධානය කළ බුදුරජාණන් වහන්සේ ඉන් හරි අඩක්ම ස්ත්‍රී පක්ෂයට හිමිකර දීමෙන් ස්ත්‍රියගේ ශ්‍රේෂ්ඨත්වය ලෝකයාට පෙන්වා දුන්හ.

බුදු දහමේ උත්තරීතර තත්ත්වය වනුයේ නිවන් අවබෝධ කර ගැනීමයි. එයට නුවණ අවශ්‍ය වෙයි. නුවණින් තොර අයට නිවන් අවබෝධය දුෂ්කර වෙයි. එම නිවන අවබෝධ කර ගැනිමට තරම් උසස් ඥාණ ශක්තියක් කාන්තාව සතුව පැවති බව මහා ප්‍රජාපති ගෝතමිය ඛේමා උප්පලවණ්ණා, යශෝධරා ආදී රහත් මෙහෙණින් වහන්සේගේ ජීවිත තුළින් ප්‍රත්‍යක්ෂ කර දීමට බුදුරජාණන් වහන්සේ මාර්ගය සලසා දුන්හ.

සත් හැවිරිදි වියෝ සෝවාන් වීමට තරම් උසස් ඥාණ ශක්තියකින් යුතුව සිටි විශාඛා වැනි ශ්‍රේෂ්ඨ කාන්තාවන් අවිදු අඳුරේ ගැලී සිටි පිරිස් ඉන් මුදා යහපත් මාර්ගයේ ගමන් කරවීමට කටයුතු කිරීමෙන් ස්ත්‍රියකගේ ඇති වටිනාකම සමාජයයට ප්‍රත්‍යක්ෂ විය.

මව් පදවිය වැනි උත්තරීතර තත්ත්වයක් ලබා ගන්නා කාන්තාව එමගින් සමාජයට සිදු කරන උසස් මෙහෙවර බුදු දහමේ විස්තර කර දෙයි. බ්‍රහ්මයාට එදා සමාජ තලයේ උසස් තත්ත්වයක් හිමිව තිබිණි. මව්පිය දෙපල දරුවන්ට බ්‍රහ්මයා හා සමානකර දැක්වීමෙන් එම උසස් පිළිගැනීමට ස්ත්‍රියද ඇතුළත් කිරීමට උන්වහන්සේ කටයුතු කළහ. එතෙක් පැවති විවිධ අන්දමේ දුක් ගැහැට වලින් මිදී ස්ත්‍රිය ලැබූ සැනසීම ථෙරී ගාථාවලින් පැහැදිලි වෙයි.

ජන සමාජයක් ඔපවත් වීම පිණිස එම සමාජය තුළ බල පවත්නා සාරධර්ම බෙහෙවින් ඉවහන් වෙයි. එම සාරධර්ම තුළින් සමාජය පොහොසත් වන විට ලෝකයාගේ ගෞරවාදරයට එම ජන සමාජය ලක්වෙයි. වසර දෙදහස් ගණනක් තිස්සේ ලාංකික ජන සමාජය ලෝකයාගේ ගෞරවාදරයට පාත්‍රව ඇති බව ඉතිහාසය පෙන්වා දෙයි. එවන් උසස් සම්මානනීය තත්ත්වයකට ලංකා ජන සමාජය සකස් වීමට බුදු දහමේ අභාෂය ඉවහල් වූ බව පැහැදිලිය. මේ සඳහා ලංකාවේ වනිතා පක්ෂය වෙතින් ඉටු වූ කාර්ය භාරය ඉතා වැදගත් වේ. කාන්තා පරපුරට පුළුවන් උසස් කාර්යභාරයක් ඉටු කිරීමට මාවත සකස් කිරීම ආරම්භ වූ දිනයක් වශයෙන් උඳුවප් පොහෝ දිනය විශේෂයෙන්

සඳහන් කළ යුතු වෙයි. ලංකාවේ කාන්තා පක්ෂයට විමුක්තිය සලසා දුන් දිනයක් වශයෙන්ද ඓතිහාසික වටිනාකමක් මෙදිනට හිමිව ඇත.

මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කොට ලාංකික ජන සමාජයට හඳුන්වා දුන් බුදු දහමේ ආලෝකය ලක් දෙරණ සිසාරා පැතිර යාමට වැඩි කාලයක් ගත නොවීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ අය භික්ෂු ශාසනයට ඇතුළත්ව සසර විමුක්තිය සලසා ගත්හ. එහෙත් කාන්තා පක්ෂයට පැවිදි බව ලැබීමට ඒ වනවිට අවස්ථාවක් නොවීය.

මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට මාවත සකස් කළ මිහිඳු මහ රහතන් වහන්සේ දෙවන පෑතිස් රජතුමාගේ ආරාධනයෙන් තම පියාණන් වූ අශෝක රජතුමාට දන්වා යවා සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ ප්‍රධාන භික්ෂුණීන් වහන්සේ ලංකාවට වැඩම කරවා ගැනීමට කටයුතු සැලසූහ. ඒ අනුව බුදුරජාණන් වහන්සේට බුද්ධත්වය ලැබීමේදී පිට දීමට උපකාරී වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවක්ද රැගෙන සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ තවත් භික්ෂුණීන් වහන්සේ සමග උඳුවප් පුනු පොහෝ දින ලක්දිවට වැඩම කළහ. දහම් අසා සෝවාන්ව සිටි අනුලා බිසව ප්‍රධාන වනිතාවෝ පැවිදි බව ලැබූහ. ලංකාවේ කාන්තාවන්ට විමුක්තිය සලසා දෙමින් මෙසේ ආරම්භ වූ මෙහෙනි සස්නට ඇතුළත් වූ දස දහස් ගණන් මෙහෙණින් වහන්සේ බුදු සසුන ලක්දිව ව්‍යාප්ත කරවීම පිණිස උදාර මෙහෙවරක් සිදු කළහ.

ලාංකික ජන සමාජය ඔපවත් කිරීමට මාර්ගය මේ මගින් උදාවූ බව පැහැදිලිය. මෙසේ ලංකාවේ කීර්තිමත් තත්ත්වයට පත්වූ මෙහෙණින් වහන්සේ චීනයට වැඩම කර එහි භික්ෂුණී ශාසනය පිහිටුවීමට කටයුතු කිරීම නිසා ජාත්‍යන්තර කීර්තියක්ද හිමිකර ගත්හ. එදා මහ මෙව්නාවේ රෝපිත ශ්‍රී මහා බෝධිය අද දක්වාම මුළු මහත් ලෝකයාගේ ගෞරවයට ලක්වී ඇති අතර. ලෝකයේ ඉපැරණි වෘක්ෂය ලෙස ද ගෞරවයට පාත්‍රව ඇත. මෙනිසා උඳුවප් පොහෝ දිනය ලාංකික ජන සමාජයට ඉතා වැදගත් දිනයක් ලෙස සඳහන් කළ හැකිය.

ශ්‍රී ලාංකික ජන සමාජයේ මහත් ගෞරවාදරයට ලක්ව ඇති ශ්‍රී පාදස්ථානය වන්දනා කිරීම ඇරඹෙන්නේද උඳුවප් පුනු පොහෝ දිනයේදීය. වෙසක් පුනු පොහෝ දිනය දක්වා ලංකාවේ සතර දිග් භාගයෙන් ජනතාව ශ්‍රී පාදස්ථානයට වන්දනා මාන කිරීම සඳහා ඇදී ඒම ආරම්භ වන්නේ මෙම දිනයේ වීම වැදගත් වෙයි.

ලංකාවේ වනිතා පක්ෂයට විමුක්තිය සැලසුන දිනයක් වශයෙනුත්, පරම පූජනීය ශ්‍රේෂ්ඨ පාරිභෝගික ධාතූන් වහන්සේ වශයෙන් මහත් ගෞරවාදරයට ලක් වූ ශ්‍රී මහා බෝධි රාජයාණන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම වූ දිනය වශයෙනුත් ශ්‍රී පාදස්ථානය වන්දනා කිරීම් ආරම්භ කරන දිනය වශයෙනුත් ඉතා වැදගත් ස්ථානයක් මේ අනුව උඳුවප් පොහෝ දිනයට ලැබී ඇති බව පැහැදිලිය.

එදා බුදුරජාණන් වහන්සේ කාන්තාවකගේ වටිනාකම විදහා දක්වමින් දේශනා කළ ඉහත සඳහන් ගාථා තුළින් දැක්වූ උසස් අදහස් සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ලක්දිවට වැඩමවීමෙන් පසු ලංකාවේ කාන්තා පක්ෂය ලැබූ ගෞරවය තුළින් වඩාත් සනාථ වන බව සඳහන් කළ හැකිය.

මේ අනුව කාන්තාවට බුද්ධ ශාසනයේ ලැබී ඇත්තේ මුල් තැනකි. බෞද්ධ කුල කාන්තාවක් ශාසන ඉතිහාසයේ එන භික්ෂුණී චරිත කතා මැනවින් හදාරමින් ඒ ඒ චරිත ලක්ෂණ තම තමන්ගේ ජීවිත වලටද සම්බන්ධ කරගෙන යහපත් බෞද්ධ ආකල්ප වලින් පෝෂණය කර ගැනීමට උනන්දුවීම යුගයේ අවශ්‍යතාවයකි. ඒ සඳහා ඔබට ශක්තිය, ධෛර්යය හා වාසනාව උදාවේවා.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**